# ශ්‍රී ලංකාවේ කතෝලික දේවස්ථානවල නිරූපිත සාන්තුවරයන්ගේ සහ සාන්තුවරියන්ගේ මූර්ති

ඩබ්. එස්. වික්‍රමසිංහ[1]

ශ්‍රී ලංකාව පෘතුගීසි, ලන්දේසි, සහ ඉංග්‍රීසි පාලනයට නතු ව පැවති කාල වකවානුවේ නිර්මාණය වූ ගෘහ නිර්මාණාංග රැසකි. ඒ ගෘහ නිර්මාණාංග අතුරින් කතෝලික දේවස්ථාන සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි වේ. මේ කතෝලික දේවස්ථාන අධ්‍යයනයේ දී හමු වන තවත් සුවිශේෂ කලාංගයක් ලෙස සාන්තුවර සාන්තුවරියන්ගේ ප්‍රතිමා වැදගත් වේ. සාන්තුවර සාන්තුවරියන් යනු ශුද්ධ සභාව විසින් ශුද්ධවන්තයන් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කරන ලද පිරිසකි. ඒ ශුද්ධවන්තයන් උපතින් සාමාන්‍ය පුද්ගලයන් වුව ද, සාමාන්‍ය දේ අසාමාන්‍ය ස්වරූපයකින් කළ පුද්ගලයන් ලෙස සැලකේ. මේ අනුව සාන්තුවර සාන්තුවරියන් ලෙස සැලකෙන්නෝ මිනිසුන් වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් වන උත්තමයෝ ය. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතු ව පැවති කාල වකවානුවේ නිර්මාණය වූ මීගමුව, කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ඇති ප්‍රධාන දේවස්ථාන වූ කොටහේන ශාන්ත ලුසියා දෙව්මැදුර, බොරැල්ල සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානය, මීගමුව මහ පල්ලිය, කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ආදියේ සාන්තු ප්‍රතිමා වැදගත් වේ. මේ දේවස්ථානවල එයට කැප කළ සාන්තුවරයකු හෝ සාන්තුවරියක වේ. ඇතැම් දේවස්ථානවල සියලු සාන්තුවරුන් නියෝජනය වන පරිදි සාන්තුවර සාන්තුවරියන්ගේ මූර්ති නිර්මාණය කර ඇත. එමෙන් ම හැම දේවස්ථානයක ම සාන්තුවර සාන්තුවරියන්ගේ මූර්ති විදෙස් රටවලින් ගෙන්වා ඇති අතර, ඒ ප්‍රතිමාවල ග්‍රීක රෝම කලා ලක්ෂණ ද, පුනරුද කලා ලක්ෂණ ද අඩු වැඩි වශයෙන් අනූන වේ. හැම ප්‍රතිමාවක් ම හිටි පිළිම වන අතර ඔවුන්ට ආවේණික වර්ණවලින් යුක්ත ව සියලු ප්‍රතිමා අලංකාර වස්ත්‍රයෙන් සරසා ඇත. සියලු ම ප්‍රතිමා ඔවුන්ට ආවේණික යම් යම් මුද්‍රා හෝ යම් වස්තුවක් අතැති ව දක්වා තිබීම මේ මූර්තිවල දක්නට ලැබෙන තවත් සුවිශේෂ ලක්ෂණයකි. කුලුන මධ්‍යයේ අලංකාර පාදමක් මත මේ මූර්ති තබා ඇත. ඒ පාදම අලංකාර මල් ලියකම්වලින් යුක්ත රෝම කොරින්තියානු කුලුනු හිසක ස්වරූපයක් ගනී. මේ පාදම මත මූර්ති තැබීමත් සමඟ මූර්තියට යම් දිව්‍යමය බවක් මෙන් ම යම් ආකර්ෂණයක් ද එක් වී ඇත. කෙසේ නමුත්, යටත්විජිත පාලන සමයයේ නිර්මාණ වූ කතෝලික දේවස්ථානවල අලංකරණ අංගයක් මෙන් ම පූජනීයත්වයට පාත්‍ර වූ සාන්තුවර සාන්තුවරියන්ගේ ප්‍රතිමා දේවස්ථානයක අත්‍යවශ්‍ය ම අංගයක් ලෙස හැඳින්විය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** කතෝලික දේවස්ථාන, ප්‍රතිමා, සැරසිලි, ග්‍රීක රෝම කලා ලක්ෂණ, පුනරුද කලා ලක්ෂණ

[1] දෘශ්‍ය කලා සැලැසුම්කරණය සහ ප්‍රාසඟිංක කලා ඒකකය, ලලිත කලා අධ්‍යයනාංශය